කොවිඩ්-19 සම්බන්ධ වාර්තාකරණයේදී භාවිතා කළ යුතු නිර්දේශයන් ඉදිරිපත් කරනා සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය සඳහන් කරන්නේ, නිරෝධායනයට ලක් කරන්නවුන්/රෝගීන්/මියගිය පුද්ගලයින් පිළිබඳ වාර්තාකරණයේදී කිසිවිටකත් ජාතිය සහ ආගම සඳහන් නොකරන ලෙසිනි. කෙසේ වෙතත් මෙම නිර්දේශය ඇතැම් ජනමාධ්‍ය මගින් උල්ලංඝනය කරනු නිරීක්ෂණය වේ.

මෙම අරුණ පුවත ඊට එක් උදාහරණයකි. මෙහිදී "මැණික් ව්‍යාපාරිකයන් දෙදෙනාගේ නිවෙස්වල හා ඥාති නිවෙස්වල වැඩි ජනගනත්වයක් (sic) සිටින ජාතියක් වූයෙන් ඔවුන් අතර රෝගය පැතිරයාම වළක්වාලීම අසීරු කාරණාවක් ද විය" යනුවෙන් සඳහන් කෙරේ. මෙහිදී "වැඩි ජනගනත්වයක් (sic) සිටිනා ජාතියක්" ලෙසින් අදහස් කෙරෙන්නේ කුමන ජනවර්ගයක්ද? එම ජනවර්ගය වැඩි ජන ඝනත්වයකින් යුතු වන්නේ කුමන පරාමිතීන් යටතේද? අදාළ මාධ්‍යවේදියා එම නිගමනයට එළැඹ ඇත්තේ කුමන මූලාශ්‍ර පදනම් කරගනිමින්ද? එසේම එම කාරණය මෙම පුවතට අදාළ වන්නේ කුමනාකාරයකින්ද? මෙම ගැටළු වලට සාධනීය පිළිතුරු නොමැත්තේ නම් අපට නිගමනය කිරීමට සිදුවන්නේ, අරුණ පුවත්පතේ මෙම ලිපිය ඔස්සේ උක්ත සඳහන් ජනමාධ්‍ය පිළිපැදිය යුතු නිර්දේශයන් උල්ලංඝනය කෙරී ඇති බව පමණි. මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

මූලාශ්‍ර:
https://mcusercontent.com/e5e1192127653987d107e6f98/images/6a771830-d3bd-456e-8fbf-8e11372e9adc.png

#MediaEthics #lka #SinhalaPress #Aruna